61320



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ........................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| **ප්‍රශ්න අංක** | **ලකුණු** |
| **01 - 30** | |
| **31 - 50** | |
| **එකතුව** | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**1.** අවශ්‍යතා සහ වුවමනා සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

A – සෞඛ්‍යය
B – වාසස්ථාන
C – ඇඳුම්
D – ලැප්ටොප් (Laptops)
E – සිසිල් බීම
F – ජංගම දුරකථන
G – කතන්දර පොත්
H – ආහාර

ඉහත දෑ අතුරෙන්, වුවමනා පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, D, E (2) A, C, E, H (3) C, D, E, F
(4) C, D, E, H (5) D, E, F, G (......)

**2.** පහත දෑ අතුරෙන්, සේවාවක දැකිය හැකි ගුණාංගයක් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) ස්පර්ශ කළ හැකි බව (2) පැවරිය හැකි බව (3) ආපසු යැවිය හැකි බව
(4) වෙන් කළ නොහැකි බව (5) නෂ්‍ය නොවන බව (......)

**3.** දළ දේශීය නිෂ්පාදිතය (GDP) තුළ සේවා අංශය නියෝජනය වන්නේ,

(1) රාජ්‍ය අංශය මඟිනි. (2) පෞද්ගලික අංශය මඟිනි. (3) ප්‍රාථමික අංශය මඟිනි.
(4) ද්විතීයික අංශය මඟිනි. (5) තෘතීයික අංශය මඟිනි. (......)

**4.** ලෝකය තුළ ව්‍යාප්ත වූ ගැටලු කිහිපයක් පහත දැක්වේ.

A – වන විනාශය
B – ස්ථූලතාවය
C – ආදායම් විෂමතාවය
D – වායු දූෂණය
E – බුද්ධි ගලනය
F – ජෛව විවිධත්වය නැතිවීම
G – විරැකියාව
H – පාංශු ඛාදනය

ඉහත දෑ අතුරෙන්, සමාජ - ආර්ථික ගැටලු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, E, F (2) B, C, E, G (3) B, C, E, H
(4) C, D, E, G (5) C, E, G, H (......)

**5.** ශ්‍රී ලංකාවේ 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ සඳහන් **නොවන** අරමුණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) හානිදායක භාණ්ඩ අලෙවියෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම
(2) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම
(3) පාරිභෝගිකයින් සඳහා පුළුල් පරාසයක භාණ්ඩ හා සේවා ඇති බවට සහතික කිරීම
(4) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයින්ට සහනයක් ලබා දීම
(5) තරගකාරී මිලට භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා පාරිභෝගිකයින්ට ප්‍රවේශයක් ලබා දීම (......)

[දෙවැනි පිටුව බලන්න.

**6.** පහත වගුවේ ව්‍යාපාර පාර්ශ්වකරුවන් සහ ව්‍යාපාර කටයුතු සඳහා ඔවුන්ගේ මැදිහත්වීම් කිහිපයක් දැක්වේ.


| පාර්ශ්වකරුවන් | මැදිහත්වීම |
|---|---|
| (i) කොටස්කරුවන් | A - අධ්‍යක්ෂ මණ්ඩලය තෝරාගැනීම |
| (ii) පාරිභෝගිකයින් | B - උපායමාර්ග සැකසීම |
| (iii) සැපයුම්කරුවන් | C - මෙහෙයුම් ක්‍රියාකාරකම්වල නියුක්ත වීම |
| (iv) කළමනාකරුවන් | D - වෙළෙඳ කොන්දේසි සාකච්ඡා කිරීම |
| (v) සේවකයින් | E - භාණ්ඩවල ගුණත්වය පිළිබඳ ප්‍රතිචාර දැක්වීම |

ඉහත දක්වා ඇති පාර්ශ්වකරුවන්ගේ අනුපිළිවෙළ අනුව මැදිහත්වීම නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, E, B, C
(2) A, E, D, B, C
(3) B, E, C, D, A
(4) D, B, A, C, E
(5) D, E, B, A, C

(......)

**7.** පහත සඳහන් රූපසටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




මිල දී ගැනීමේ හැකියාව

පහසු භාණ්ඩයක් සඳහා මිල දී ගැනීමේ හැකියාව සහ උද්ධමනය අතර ඇති සම්බන්ධතාවය නිවැරදිව ප්‍රස්තාරයේ නිරූපණය වන අක්ෂරය/අක්ෂර මොනවා ද?

(1) Ⓐ පමණි
(2) Ⓓ පමණි
(3) Ⓐ සහ Ⓓ පමණි
(4) Ⓑ සහ Ⓒ පමණි
(5) Ⓒ සහ Ⓓ පමණි

(......)

**8.** රජයන්ගේ සහ ව්‍යාපාරවල අරමුණු කිහිපයක් පහත දැක්වේ.

A – වැඩ-ජීවන ගුණත්ව ප්‍රවර්ධනය
B – කාර්මීකරණය ප්‍රවර්ධනය
C – නිෂ්පාදිත බිහි කිරීම
D – ආදායම් ප්‍රතිව්‍යාප්තිය
E – පූර්ණ සේවා නියුක්තිය පවත්වා ගැනීම
F – මිල ස්ථායිතාවය
G – සේවක කැපවීම ප්‍රවර්ධනය
H – ආයතනික පාලනය පවත්වා ගැනීම

ඉහත දෑ අතුරෙන්, රජයේ අරමුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, G, H
(2) A, D, E, F
(3) B, D, E, F
(4) B, D, F, G
(5) D, E, F, G

(......)

**9.** හවුල් ව්‍යාපාරයක, සීමිත හවුල්කරුවන් හඳුනාගත හැකි වන්නේ,

(1) වගකීම සීමිත වීම මගිනි.
(2) කළමනාකරණයට සම්බන්ධ වීම මගිනි.
(3) කළමනාකරණයට සම්බන්ධ නොවීම මගිනි.
(4) සීමිත වගකීම සහ කළමනාකරණයට සම්බන්ධ වීම මගිනි.
(5) සීමිත වගකීම සහ කළමනාකරණයට සම්බන්ධ නොවීම මගිනි.

(......)

**10.** සමාගමක් සංස්ථාපනය කිරීමේ දී භාවිත කරන ලේඛන පිළිබඳව ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

**ප්‍රකාශය A** : සාංගමික ව්‍යවස්ථාවලියේ කොටස් නිකුතුව, අධ්‍යක්ෂවරුන්ගේ බලතල සහ කාර්යයන් යනාදී විස්තර දැක්වේ.

**ප්‍රකාශය B** : සංස්ථාපන සහතිකයේ කොටස්කරුවන්ගේ ඡන්ද අයිතිය, නීති හා රෙගුලාසි යනාදී විස්තර දැක්වේ.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** පමණක් නිවැරදි වේ.
(2) **B** පමණක් නිවැරදි වේ.
(3) **A** හා **B** දෙකම වැරදි වේ.
(4) **A** හා **B** නිවැරදි වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** හා **B** නිවැරදි වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ.

(......)

**11.** පහතින් දක්වා ඇත්තේ ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවරයන් ය.

A – යථාර්ථයක් බවට පත් කරගැනීම
B – නව්‍යතා සොයා ගැනීම
C – ප්‍රතිලාභ ලැබීම
D – ව්‍යාපාර සැලැස්ම සැකසීම
E – සම්පත් සම්පාදනය

ඉහත දක්වා ඇති ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) A, C, D, B, E
(2) B, C, A, E, D
(3) B, D, E, A, C
(4) D, A, B, E, C
(5) D, E, A, B, C

(......)

**12.** තෙවන පාර්ශ්වයක මැදිහත්වීමක් අවශ්‍ය **නොවන** හුවමාරු මාධ්‍යයක් වන්නේ,

(1) මුදල් ය.
(2) චෙක්පත් ය.
(3) ණයපත් ය.
(4) විද්‍යුත් මුදල් ය.
(5) පෙර ගෙවුම් කාඩ්පත් ය.

(......)

**13.** ධාරක චෙක්පත්කට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) චෙක්පත ඉරී හෝ හානි වී තිබීම.
(2) ගණන සඳහන් නොකර අත්සන යෙදීම.
(3) කල් ඉකුත් වීම හේතුවෙන් තවදුරටත් වලංගු නොවීම.
(4) බැංකුවට ඉදිරිපත් කරන ඕනෑම අයෙකුට මුදල් ලබා ගැනීමට හෝ තැන්පත් කිරීමට හැකිවීම.
(5) චෙක්පතෙහි නම සඳහන් අයට පමණක් මුදල් ලබා ගැනීමට හෝ තැන්පත් කිරීමට හැකිවීම.

(......)

**14.** සංවිධානයක් මෝටර් රථ රක්ෂණ ආවරණයක් ලබා ගැනීමේ අරමුණ වනුයේ,

(1) අවදානම අවම කිරීම ය.
(2) අවදානම මගහැරීම ය.
(3) අවදානම පැවරීම ය.
(4) අවදානම දැරීම ය.
(5) අවදානම භාරගැනීම ය.

(......)

**15.** පහත ඒවා අතුරෙන්, සාමාජික රටවල් අතර මූල්‍ය ස්ථායීතාවය සහතික කිරීම සුවිශේෂී කරගත් ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?

(1) ලෝක වෙළෙඳ සංවිධානය (WTO)
(2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
(3) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(4) අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN)
(5) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC)

(......)

**16.** සන්නිවේදන මාධ්‍යයන් කිහිපයක් පහත දැක්වේ.

A – ලිපිය
B – දැන්වීම
C – දුරකථනය
D – එකිනෙකා හමුවීම
E – වීඩියෝ සම්මන්ත්‍රණ
F – කෘත්‍රිම බුද්ධි චැට්බෝට් (AI chatbot)
G – මෙමෝ පත්‍ර
H – ෆැක්ස්

ඉහත දෑ අතුරෙන්, ක්ෂණිකව ප්‍රතිපෝෂණය දැක්විය හැකි මාධ්‍ය පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, D, F
(2) B, C, D, E
(3) B, D, E, F
(4) C, D, E, F
(5) C, E, F, G

(......)

**17.** සැලසුමක් නිවැරදි ආකාරයට ක්‍රියාත්මක කිරීම මගින් සහතික කරනුයේ,

(1) සඵලදායකත්වයයි.
(2) ලාභදායකත්වයයි.
(3) ඵලදායකත්වයයි.
(4) තිරසරභාවයයි.
(5) කාර්යක්ෂමතාවයයි.

(......)

**18.** පහත දෑ අතුරෙන්, තීරණ ගැනීමේ දී සන්දර්භයට අනුගත වී කටයුතු කරනු ලබන්නේ කුමන නායකත්ව ශෛලයය ද?

(1) ප්‍රජාතන්ත්‍රවාදී
(2) ඒකාධිපති
(3) අවස්ථානුකූල
(4) නිර්බාධවාදී
(5) කාර්ය අභිමුඛ

(......)

**19.** 2021 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) සම්බන්ධව ගොඩනගන ලද ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

**ප්‍රකාශය A** : ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) මගින් ලබාදෙන දායකත්වය 50% කට වඩා වැඩි වේ.

**ප්‍රකාශය B** : ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) මගින් ශ්‍රී ලංකාවට ලබාදෙන දායකත්වය සංවර්ධිත රටවල් හා සැසඳීමේ දී සාපේක්ෂව වැඩි අගයකි.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** පමණක් නිවැරදි වේ.
(2) **B** පමණක් නිවැරදි වේ.
(3) **A** හා **B** දෙකම වැරදි වේ.
(4) **A** හා **B** නිවැරදි වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** හා **B** නිවැරදි වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ. (......)

**20.** සංවිධාන ව්‍යුහය හා පාලන අවකාශය අතර ඇති සම්බන්ධතාවය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

| | සංවිධාන ව්‍යුහය | පාලන අවකාශය |
|---|---|---|
| (1) | උස වන විට | පුළුල් වේ |
| (2) | උස වන විට | පටු වේ |
| (3) | උස වන විට | වෙනස් නොවේ |
| (4) | පැතලි වන විට | වෙනස් නොවේ |
| (5) | පැතලි වන විට | පටු වේ |

(......)

**21.** මාර්ගගත බැංකු ක්‍රමය මගින් ලබාගත **නොහැකි** සේවාවක් වනුයේ,

(1) ගිණුමක් ආරම්භ කිරීම ය. (2) බිල්පත් ගෙවීම ය. (3) අරමුදල් හුවමාරුව ය.
(4) මුදල් ආපසු ගැනීම ය. (5) ගිණුම් ශේෂ පරීක්ෂාව ය. (......)

**22.** සමාගමක ක්ෂණික අනුපාතය 0.5 සහ ජංගම අනුපාතය 1.7 ක් වේ නම්, ජංගම වත්කම්වල වැඩි වශයෙන් අඩංගු වන්නේ,

(1) අතැති මුදල් ය. (2) කලින් ගෙවූ වියදම් ය. (3) ණයගැතියෝ ය.
(4) බැංකු ශේෂය ය. (5) තොගය ය. (......)

**23.** පහත වගුවේ පාරිභෝගිකයින් හා සම්බන්ධ යෙදුම් සහ ඒවාට අදාළ විස්තර දක්වා ඇත.

| යෙදුම් | විස්තර |
|---|---|
| (i) තෘප්තිය | A - නිෂ්පාදිතයක සමස්ත ඇගයීම |
| (ii) පක්ෂපාතිත්වය | B - භාණ්ඩ හා සේවාවන් |
| (iii) අගය | C - චිත්තවේගී අවශ්‍යතා පිරිමැසීම |
| (iv) පිරිනැමීම | D - අපේක්ෂාවන් ඉටු වීම හෝ ඉක්මවා යාම |
| (v) රැකවරණය (Care) | E - නැවත මිල දී ගැනීමට ඇති කැමැත්ත |

ඉහත දී ඇති යෙදුම් අනුපිළිවෙළ අනුව ඊට ගැළපෙන විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) B, E, A, C, D (2) B, E, A, D, C (3) C, E, A, D, B
(4) D, A, E, B, C (5) D, E, A, B, C (......)

**24.** ප්‍රචාරණයේ සහ ප්‍රසිද්ධියේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – ඒක පාර්ශ්වීය සන්නිවේදනය B – අපෞද්ගලික වීම
C – ඉහළ පිරිවැය D – විශේෂිත අනුග්‍රාහකයකු වීම
E – විශාල ප්‍රේක්ෂක පිරිසක් සිටීම F – පාලනය කළ හැකි වීම

ඉහත දෑ අතුරෙන්, ප්‍රචාරණයේ ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, D, E (2) B, D, F (3) B, E, F (4) C, D, F (5) C, E, D (......)

[පස්වැනි පිටුව බලන්න.

**25.** තෝලන අනුපාතයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නුබුන්වත් බව හඳුනා ගැනීමට ඇති හැකියාව
(2) මෙහෙයුම් කාර්යක්ෂමතාව මැනීමට ඇති හැකියාව
(3) කෙටිකාලීන ගෙවීම් ආවරණය කරගැනීමට ඇති හැකියාව
(4) මූල්‍ය අවදානම හඳුනාගැනීමට ඇති හැකියාව
(5) කොටසක ඉපැයුම් පුරෝකථනය කිරීමට ඇති හැකියාව
(……)

**26.** පහත දැක්වෙන අතරමැදියන් අතුරෙන් භාණ්ඩයේ හිමිකම ඇතිව භුවමාරු ක්‍රියාවලියට සම්බන්ධවන පාර්ශ්වය වන්නේ,
(1) කොමිස් නියෝජිතයා ය.
(2) තොග වෙළෙන්දා ය.
(3) තැරැව්කරු ය.
(4) සාධ්‍යකයා ය.
(5) වෙන්දේසිකරු ය.
(……)

**27.** පහත වගුවේ සේවක තෝරාගැනීමේ පරීක්ෂණ හා ඒවායේ අරමුණු කිහිපයක් දක්වා ඇත.

| තෝරාගැනීමේ පරීක්ෂණ | අරමුණ |
|---|---|
| (i) ශාරීරික හැකියාව | A - ආතතික තත්ත්ව යටතේ සේවය කිරීමේ හැකියාව මැනීම |
| (ii) බුද්ධිය (IQ) | B - අභියෝගවලට මුහුණදීමට ඇති පුද්ගල හැකියාව මැනීම |
| (iii) පෞරුෂය | C - ශක්තිය හා දරාගැනීමේ හැකියාව මැනීම |
| (iv) පසුබිම | D - විශේෂිත කාර්යයක් ඉටුකිරීමට ඇති හැකියාව මැනීම |
| (v) ප්‍රායෝගික | E - විධිමත් ලේඛන මගින් තොරතුරු තහවුරු කරගැනීම |

ඉහත දක්වා ඇති තෝරාගැනීමේ පරීක්ෂණ අනුපිළිවෙළ අනුව ඒව අදාළ අරමුණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, A, E, D
(2) C, B, A, E, D
(3) C, B, E, A, D
(4) D, C, A, E, B
(5) D, C, B, A, E
(……)

**28.** සේවක සංවර්ධන වැඩසටහන්වලදී අවධානය යොමුකළ යුත්තේ,
(1) රැකියා කාර්යන් ඉටුකිරීම සඳහා නිවැරදි දැනුම හා කුසලතා ලබා දීමට ය.
(2) වර්තමාන රැකියාව හා සම්බන්ධිත කුසලතා පරතරය අවම කිරීමට ය.
(3) සංවිධානයක ඉගෙනුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට ය.
(4) සංවිධානයේ වර්තමාන තාක්ෂණය භාවිත කිරීමේ පහසුකම් සැලසීමට ය.
(5) අනාගත වගකීම් භාර ගැනීම සඳහා සූදානම් කිරීමට ය.
(……)

**29.** ශ්‍රී ලාංකිකයෙකුට තම සමස්ත ණය වගකීම් පිළිබඳව වාර්තාවක් ලබාගත හැක්කේ,
(1) ශ්‍රී ලංකා මහ බැංකුව මගිනි.
(2) ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුව මගිනි.
(3) ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව මගිනි.
(4) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය මගිනි.
(5) රාජ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව මගිනි.
(……)

**30.** පහත වගුවේ තොරතුරු පද්ධති සහ ඒවා භාවිත කරන ආකාර කිහිපයක් දැක්වේ.

| තොරතුරු පද්ධති | භාවිතය |
|---|---|
| (i) ගනුදෙනු සැකසුම් පද්ධති | A - ව්‍යාපාර ආකෘති නිර්මාණය |
| (ii) කාර්යාල ස්වයංකරණ පද්ධති | B - ගනුදෙනුකරුවන්ගේ සම්බන්ධතා කළමනාකරණය |
| (iii) දැනුම් කාර්ය පද්ධති | C - තොග කළමනාකරණය |
| (iv) කළමනාකරණ තොරතුරු පද්ධති | D - ව්‍යාපාරික පුරෝකථන |
| (v) විධායක උපකාරක පද්ධති | E - විද්‍යුත් ලිපි සන්නිවේදනය |

ඉහත දී ඇති තොරතුරු පද්ධති අනුපිළිවෙළ අනුව ඒට අදාළ භාවිතය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, E, D, A
(2) C, E, A, B, D
(3) C, E, A, D, B
(4) D, E, A, B, C
(5) D, E, A, C, B
(……)

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) රටක තිරසර සංවර්ධනය ...................., සමාජීය සහ .................... කටයුතුවල එකතුවකි.

(ආ) ආයතනයක් රටක නීතිරීති සහ රෙගුලාසිවලට අවනතවීම .................... වගකීම වන අතර, ප්‍රජාවගේ යහපත උදෙසා ආයතනයක් ක්‍රියාමාර්ග ගැනීම .................... වගකීම වේ.

**32.** (අ) ව්‍යවස්ථාපිත .................... අවශ්‍යතාවය යනු බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම තැන්පතු වගකීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යා යුතු .................... තැන්පතු ප්‍රමාණය වේ.

(ආ) ශ්‍රී ලංකාවේ රජය, නීති සම්පාදනය මගින් සිදු කරනුයේ .................... ප්‍රතිපත්ති වන අතර මහ බැංකුව විසින් සිදු කරනුයේ .................... ප්‍රතිපත්ති සම්පාදනයයි.

**33.** (අ) ව්‍යාපාරයේ සමස්ත අපේක්ෂාව දක්වන ප්‍රකාශය .................... වන අතර ව්‍යාපාරයක් පවත්වාගැනීමේ හේතුව නිරූපණය වන්නේ .................... ප්‍රකාශය මගිනි.

(ආ) නිෂ්පාදන ආයතනයක යන්ත්‍ර, භාවිතයට පෙර පරීක්ෂාව .................... පාලනය වන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ දී තත්ත්ව පාලනය සිදු කිරීම .................... පාලනය වේ.

**34.** (අ) මුහුණේ ඉරියව් .................... සන්නිවේදනයට උදාහරණයක් වන අතර මුහුණට මුහුණලා සිදු කෙරෙන සංවාද .................... සන්නිවේදනයට උදාහරණයක් වේ.

(ආ) ඉන්ට්‍රානෙට් (Intranet) මූලිකව නිමවුම් කර ඇත්තේ ආයතනයක .................... දත්ත සන්නිවේදන පරමාර්ථය සඳහා වන අතර එක්ස්ට්‍රානෙට් (Extranet) නිමවුම් කර ඇත්තේ ජාල පහසුකම නිශ්චිත .................... පාර්ශ්වයකට පුළුල් කිරීම සඳහා ය.

**35.** (අ) ABC විශ්ලේෂණය .................... කළමනාකරණය සඳහා භාවිත කරන අතර .................... විශ්ලේෂණය භාවිත කරනුයේ සමස්ත පිරිවැය හා සමස්ත ආදායම සමාන වන අවස්ථාව තීරණය කර ගැනීමට ය.

(ආ) නිෂ්පාදන සංකල්පය .................... අභිමුඛ වන අතර .................... සංකල්පය ගනුදෙනුකරු අභිමුඛ වේ.

**36.** (අ) පෞද්ගලික පරිභෝජනය සඳහා පුද්ගලයන් භාණ්ඩ මිල දී ගන්නා ස්ථානය .................... වෙළෙඳපොළ වන අතර B2B ගනුදෙනු සිදුවන ස්ථානය.................... වෙළෙඳපොළ වේ.

(ආ) නව නිපැයුම්කරුවන් වෙත නව නිපැයුමක් නිෂ්පාදනය, භාවිතය සහ අලෙවිය සඳහා විශේෂිත අයිතිය ලබා දීම .................... වන අතර නිශ්චිත නිෂ්පාදනයක් හඳුනාගැනීම සඳහා විශේෂිත වූ සංකේතයක් හෝ වචනයක් යොදාගැනීම .................... වේ.

**37.** (අ) ව්‍යාපාරයක ගමන්මග නිරූපණය වන්නේ .................... සැලසුම මගින් වන අතර එහි මූලික කරුණු දක්වනු ලබන්නේ .................... සාරාංශය මගිනි.

(ආ) කළමනාකරුගේ සන්නිවේදනය, කණ්ඩායම් වැඩ කිරීමේ හැකියාව සහ මෙහෙයවීමට ඇති හැකියාව යනාදිය .................... කුසලතා වන අතර, උපකරණ හා ක්‍රම භාවිතය සඳහා ඇති හැකියාව .................... කුසලතා වේ.

**38.** (අ) සාමාන්‍ය කොටස් හිමියකු මූල්‍ය වගයෙන් පාඩු ලැබීමේ සම්භාවිතාවය .................... වන අතර ඔහුට කොටස් ආයෝජනය වෙනුවෙන් සමාගම වෙන් කරනු ලබන ලාභය .................... ලෙස හඳුන්වනු ලැබේ.

(ආ) සමාගම් දෙකක් එක් ආයතනයක් ලෙස පරිවර්තනය වීම .................... වන අතර එක් සමාගමක් වෙනත් සමාගමක් විසින් මිලට ගැනීම .................... වේ.

**39.** (අ) සමාගමක් විසින් විද්‍යුත් වාණිජ සේවා බාහිරෙන් ලබා ගැනීම .............................. ක්‍රම කාර්යය සම්පාදනය/ප්‍රවාහනය හා සැපයුම් සේවා ලෙස හඳුන්වනු ලබන අතර පාරිභෝගිකයා විසින් විකුණුම්කරු වෙත මිල දී ගත් භාණ්ඩ නැවත යැවීම ..................... ක්‍රම කාර්යය සම්පාදනය/ප්‍රවාහනය හා සැපයුම් සේවා වේ.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ජංගම නොවන වත්කම් මිලට ගැනීම ..................... ක්‍රියාකාරකම් සඳහා උදාහරණයක් වන අතර, සාමාන්‍ය කොටස් නිකුතුව ..................... ක්‍රියාකාරකම් සඳහා උදාහරණයක් වේ.

**40.** (අ) ධාරිතාව, ප්‍රවේගය හා විවිධත්වය යන ඒවා ..................... හි ප්‍රධාන මූලිකාංග වන අතර, ව්‍යාපාරික ස්ථානයට ගමන් ගන්නා මාර්ගය (Navigation system) පෙන්වනුයේ ..................... ස්ථාන නිර්ණය පද්ධතිය තුළිනි.

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියේ අනුපිළිවෙළ අනුව කාර්ය මධ්‍යස්ථාන සැකසීම ..................... පිරියත වන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ අනුපිළිවෙළ නොසලකා කාර්ය මධ්‍යස්ථාන සැකසීම ..................... පිරියත වේ.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** දී ඇති හිස්තැන් මත ලියන්න.

**41.** සමාජීය ව්‍යවසායකත්වයේ ලක්ෂණ **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**42.** ජාත්‍යන්තර වෙළෙඳපොළට ඇතුල් වීමට ව්‍යාපාරයකට භාවිත කළ හැකි ක්‍රම **හතරක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**43.** ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු **හතර** දක්වන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**44.** පිලිප් කොට්ලර්ගේ පාරිභෝගික වටිනාකම් ධූරාවලිය අනුව නිෂ්පාදිතයක ඇති මට්ටම් **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**45.** ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ (EOQ) ප්‍රතිලාභ **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

[අටවැනි පිටුව බලන්න.

**46.** පහත දැක්වෙන එක් එක් කළමනාකරණ පද්ධතිවලට අදාළ ප්‍රමිතකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානයේ (ISO) ප්‍රමිත අංක නිවැරදිව ලියන්න.

(1) ගුණත්වය (Quality) : ISO ..............................................

(2) පරිසරය : ISO ..............................................

(3) ආහාර සුරක්ෂිතතාවය : ISO ..............................................

(4) වෘත්තීමය සෞඛ්‍යය හා ආරක්ෂාව : ISO ..............................................

**47.** සාමාන්‍ය කොටස්වල ආයෝජනය තුළින් ආයෝජකයකුට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

**48.** පහත දැක්වෙන එක් එක් අවස්ථාව සඳහා ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිත කරනු ලබන ලේඛනයෙහි නිවැරදි නම ලියන්න.

| | අවස්ථාව | ලේඛනය |
|---|---|---|
| (1) | ආනයනය කරන ලද නැවුම් පලතුරු කෘමීන්ගෙන් තොර බවට සහතික කිරීම | .............................................. |
| (2) | ආනයනකරු විසින් ගෙවිය යුතු මුදල අපනයනකරුට ගෙවන බවට බැංකුව සහතික කිරීම | .............................................. |
| (3) | විකුණුම් තහවුරු කිරීමට පෙර ආනයනකරු වෙත යවනු ලබන මූලික මිල ගණන් දැක්වීම | .............................................. |
| (4) | අපනයන භාණ්ඩ නිෂ්පාදනය කරන ලද රට සහතික කිරීම | .............................................. |

**49.** පහත එක් එක් අයිතමය පරිගණකගත තොරතුරු පද්ධතියක කවර අංගවලට අයත් වන්නේ දැයි නම් කරන්න.

(1) දෘශ්‍ය මූසිකය (Optical Mouse) : ..............................................

(2) මෘදුකාංග ඉංජිනේරුවා (Software Engineer) : ..............................................

(3) එම් එස් ඔෆිස් (MS office) : ..............................................

(4) මයික්‍රෝචිප් (Microchip) : ..............................................


**50.** සංවිධානයක සේවක ආකර්ෂණය හා තෝරාගැනීමේ ක්‍රියාවලියට අදාළ පහත රූපසටහනෙහි අංක (ii), (iv), (vi) සහ (viii) මගින් දක්වා ඇති පියවර සඳහන් කරන්න.

(1) (ii) - ..............................................

(2) (iv) - ..............................................

(3) (vi) - ..............................................

(4) (viii) - ..............................................



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** අමාලි තම යෝගට් නිෂ්පාදන ව්‍යාපාර ආයතනය 'යමී යෝගට්' නමින් ලියාපදිංචි කර, රාජ්‍ය බැංකුවකින් ලබාගත් ණය මුදලකින් පවත්වාගෙන යනු ලැබේ. සමාජ වගකීම් ඉටුකරමින් ඇය තම ව්‍යාපාර කටයුතු මෙහෙයවීමට අදහස් කරයි. අමාලි සේවකයින් පස්දෙනෙකු තම ව්‍යාපාරයට බඳවාගෙන ඇත. වර්තමානයේ ඇය විසින් තම නිෂ්පාදනයට අගය එකතු කළ හැකි නව මාර්ග සොයා බලමින් සිටියි.

(i) (අ) පහත සඳහන් එක් එක් පදනම අනුව මෙම ව්‍යාපාරය වර්ග කෙරෙන ආකාරය දක්වන්න.
(1) නිෂ්පාදනයේ ස්වභාවය (ලකුණු 01 යි)
(2) අරමුණ (ලකුණු 01 යි)

(ආ) ව්‍යාපාරය සඳහා බැංකු ණයක් ලබා ගැනීම තුළින් අමාලිට හිමිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'එකතු කළ අගය' යන්නෙහි අදහස විස්තර කරන්න. (ලකුණු 02 යි)
(ආ) නිෂ්පාදනයට අගය එකතු කිරීමෙන් අමාලිට ලබාගත හැකි වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) පහත දැක්වෙන එක් එක් කරුණ මත පදනම්ව අමාලි විසින් පිළිපැදිය යුතු නෛතික අවශ්‍යතා කවරේ දැයි සඳහන් කරන්න.
(1) ව්‍යාපාර ලියාපදිංචිය (ලකුණු 01 යි)
(2) සේවා යෝජකයා විසින් සිදුකළ යුතු සේවක භාරකාර අරමුදල් (ETF) දායකත්ව ප්‍රතිශතය (ලකුණු 01 යි)

(ආ) 'යමී යෝගට්' ආයතනය ආදායම් බදු ගෙවීම සඳහා බැඳීමක් ඇති ද නැති ද යනුවෙන් දක්වා, ඔබගේ පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) අමාලිට සිය ව්‍යාපාරය තුළින් සිදු කළ හැකි සමාජ වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) ව්‍යාපාරයක් සමාජ වගකීම්වල නිරතවිය යුත්තේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) අමාලිගේ ව්‍යාපාරයට බලපෑම් කළ හැකි බාහිර පාර්ශ්ව **දෙකක්** සහ අභ්‍යන්තර පාර්ශ්ව **දෙකක්** නම් කර, එම එක් එක් පාර්ශ්වයන් විසින් බලපෑම් කළ හැකි එක් ආකාරය බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** රසික, ඔහුගේම මෘදුකාංග සැකසීමේ ආයතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලදී. ආරම්භයේ දී ඔහු විසින් දේශීය සේවාලාභීන් වෙත ව්‍යාපාර කටයුතු සිදු කළ අතර, ජාත්‍යන්තර මට්ටම දක්වා ක්‍රමයෙන් එය වර්ධනය විය. මෙම කාලය තුළ දී රසික ගතික නායකත්ව ශෛලිය ප්‍රදර්ශනය කළ අතර ඔහුගේ සේවාලාභීන් සමඟ ඉතා යහපත් සම්බන්ධතා ගොඩනඟාගන්නා ලදී. තවද, ඔහු තම හැකියාවන් වඩාත් වර්ධනය කරගැනීම සඳහා පුහුණු වැඩසටහන්වලට සහභාගීවීමට ඇඩි කැමැත්තක් දක්වයි. ව්‍යාපාර මෙහෙයුම්වල ඇති සංකීර්ණතාවය හා පරිමාව නිසා රසික තම ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වේ.

(i) (අ) කේවල ස්වාමි ව්‍යාපාරයක ඇති සීමා **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සිද්ධිය අනුව, රසික සතු ව්‍යවසායකත්ව කුසලතා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) රසික වෙබ් අඩවි පදනම් කරගත් මෘදුකාංගයක් නිර්මාණය කළේ නම්, එය භාණ්ඩයක් ද සේවාවක් ද යන්න දක්වා, ඔබේ පිළිතුර සාධාරණීකරණයට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) කේවල ස්වාමි ව්‍යාපාරයක් හා සැසඳීමේ දී සීමාසහිත පෞද්ගලික සමාගමක ඇති වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සීමාසහිත පොදු සමාගමකට සහ සීමාසහිත පෞද්ගලික සමාගමකට අවම වශයෙන් පත් කළ යුතු අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාව වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස රසිකගේ ව්‍යාපාරය සංස්ථාපනය කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට භාර දිය යුතු ලියවිලි **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) රසිකට තම ව්‍යාපාරයේ ඇතැම් ක්‍රියාකාරකම් බාහිරකරණය (outsourcing) කර ගැනීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරික ක්‍රියාකාරකම් බාහිරකරණය කිරීමේ දී ඔහුට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස මෙම ව්‍යාපාරය මගින් ලබා දිය හැකි දායකත්ව **දෙකක්** දක්වා, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ 'රාජ්‍ය ණය කළමනාකරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) 'ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය' (SLIPS) හි කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඒකකභාර කළමනාකරණ සමාගම්වල කාර්යභාරය කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) බැංකුවක් විසින් චෙක්පතක් අගරු කිරීමේ දී 'අණකරු විමසනු' යනුවෙන් සඳහන් කරනුයේ කුමන අවස්ථාවේදී ද? (ලකුණු 02 යි)

(iii) (අ) රක්ෂණයේ ආදේශන මූලධර්මය යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) 'නැව් බඩු රක්ෂණය' යන්න හඳුන්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) 'අවිධිමත් සන්නිවේදනය' යනු කුමක් දැයි දක්වා, ඊට උදාහරණයක් සපයන්න. (ලකුණු 02 යි)

(ආ) අවිධිමත් සන්නිවේදනයේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) (අ) භාණ්ඩ ප්‍රවාහනය සඳහා බහාලුම්කරණයෙන් (containerization) ඇතිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රවාහනය හා ක්‍රම කාර්ය සම්පාදනය (logistics) අතර වෙනස්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම අතර ඇති වෙනස්කම් **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) කාර්මික රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) විද්‍යුත් ව්‍යාපාර ආකෘති **දෙකක්** සඳහන් කර, එම එක් එක් ආකෘතිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'විද්‍යුත් සිල්ලර වෙළෙඳාම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(iii) (අ) 'නිෂ්පාදිත වරලත් ව්‍යාපාර' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ජාත්‍යන්තරකරණය මගින් ව්‍යාපාරයකට ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) නෞභාරපත්‍රක කාර්යයන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'අන්තරාල වෙළෙඳාම' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(v) (අ) බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් මගින් රටකට ලබාගත හැකි වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ලකුණු 02 යි)

## II කොටස

**5.** කමලිනී මුද්‍රණ සමාගමක හිමිකාරිණියකි. සමාගම වර්ධනය වීමත් සමග සංවිධාන සටහනක් නිර්මාණය කිරීම සහ අධිකාරී බලය පැවරීම සිදුකළ යුතු බව කමලිනීට අවබෝධ විය. මුද්‍රණයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා ඇය විසින් පාලන පද්ධති සහ සේවක අභිප්‍රේරණ උපායන් යොදාගනු ලැබේ.

(i) (අ) 'සංවිධාන සටහනක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරීමේ දී කමලිනී විසින් සැලකිල්ලට ගත යුතු මූලධර්ම **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'අධිකාරී බලය පැවරීම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) අධිකාරී බලය පැවරීමේ දී කමලිනීට මුහුණ දීමට සිදුවන අභියෝග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) කමලිනීගේ සමාගම සඳහා සේවක අභිප්‍රේරණය අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) කමලිනීට තම ව්‍යාපාරය සඳහා යොදාගත හැකි මූල්‍ය නොවන අභිප්‍රේරණ උපාය විධි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) කමලිනී විසින් නිෂ්පාදනය සඳහා පරිගණක අංකිත පාලන (CNC) ක්‍රමය යොදා ගන්නේ නම් මුද්‍රණ ගුණත්වය වර්ධනය වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) කමලිනීගේ සමාගමේ නිෂ්පාදන තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| **විස්තරය** | **ඇස්තමේන්තුගත** | **සත්‍ය** |
|---|---|---|
| ඒකකයක් සඳහා අමුද්‍රව්‍ය පිරිවැය | රු. 200.00 | රු. 250.00 |
| ඒකකයක් නිපදවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය | 06 kg | 08 kg |

ජනවාරි මාසයේ දී සමාගම ඒකක 300ක් නිෂ්පාදනය කරන ලද්දේ නම්,

(1) මිල විචලනය ගණනය කරන්න. (ලකුණු 01 යි)

(2) ඉහත (1) හි ගණනය කළ මිල විචලනය කමලිනීගේ සමාගමට හිතකර ද අහිතකර ද යන්න දක්වන්න. (ලකුණු 01 යි)

(v) කමලිනී විසින් මුද්‍රණය සඳහා භාවිත කළ යුතු වඩාත් සුදුසු නිෂ්පාදන ක්‍රමය දක්වා එහි ඇති වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** කාංචන විසින් මෑතක දී විදුලි උපකරණ නිෂ්පාදන සමාගමක් ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලදී. භාණ්ඩයක ජීවන චක්‍රය අනුව ඔහුගේ නිෂ්පාදන හඳුන්වාදෙන අදියරෙහි වුව ද නිෂ්පාදනයේ ගුණත්වය පිළිබඳව ඔහු වඩාත් සැලකිලිමත් වේ. එසේම ව්‍යාපාරයේ මූල්‍ය සම්පාදන මාර්ග සහ සමච්ඡේදන ලක්ෂ්‍යය කෙරෙහි ද ඔහු උනන්දුවක් දක්වයි.

(i) (අ) හඳුන්වාදීමේ අදියරේ දී නිෂ්පාදනයක ඇතිය හැකි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදනය හඳුන්වාදීමේ අදියරේ දී කාංචනට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) නිෂ්පාදනයක් නිර්මාණය කිරීමේ දී කාංචන විසින් සැලකිල්ලට ගත යුතු ගුණත්ව මූලිකාංග **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන ප්‍රවර්ධනයේ දී කාංචනට භාවිත කළ හැකි ප්‍රචාරණ ක්‍රම **හතරක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 'වෙළෙඳපොළ ඛණ්ඩනය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) දේශීය විදුලි උපකරණ වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීම සඳහා කාංචනට භාවිත කළ හැකි ක්‍රම **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ව්‍යාපාරය සඳහා කාංචනට යොදාගත හැකි ඍජු මූල්‍ය සම්පාදන මූලාශ්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) කාංචනගේ ව්‍යාපාරය මෙහෙයවීමේ දී ප්‍රාග්ධන ආයෝජන තීරණ ගැනීමට අවශ්‍ය වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) කාංචනගේ ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ:

| | රු. |
|---|---|
| ස්ථාවර පිරිවැය | 300 000 |
| විචල්‍ය පිරිවැය (ඒකකයකට) | 500 |
| විකුණුම් මිල (ඒකකයකට) | 1 000 |

(අ) සමච්ඡේදන ලක්ෂ්‍යය ගණනය කරන්න:
(1) ඒකකවලින් (ලකුණු 01 යි)
(2) රුපියල්වලින් (ලකුණු 01 යි)

(ආ) සමාගම ඒකක 1 500ක් අලෙවි කරන්නේ නම් ලැබෙන ලාභය කොපමණ ද? (ලකුණු 01 යි)

(ඉ) සමාගම විකුණුම් මිල දෙගුණයක් කරයි නම්, ඒකක අනුව නව සමච්ඡේදන ලක්ෂ්‍යය කොපමණ වේ ද? (ලකුණු 01 යි)

(මුළු ලකුණු 20 යි)

**7.** (i) (අ) සීමාසහිත පොදු සමාගමක් කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලියාපදිංචි කරගත හැකි ආකාර **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) 'සියලු කොටස් මිල දර්ශකය' (ASPI) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) මුදල් අයවැය හා ප්‍රාග්ධන අයවැය අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මූල්‍ය කළමනාකරණයේ අරමුණු **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ආයෝජනය මත ප්‍රතිලාභ (ROI) අනුපාතය යන්න පැහැදිලි කර, ඒ ඇසුරෙන් ආයෝජකයකුට ගත හැකි තීරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සංවිධානයකට මානව සම්පත් සැලසුම්කරණය අවශ්‍ය වන්නේ ඇයි දැයි දක්වා, ඒ තුළින් ලබාගත හැකි වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) අනියම් සේවකයින් බඳවා ගැනීම මගින් සංවිධානයකට ඇතිවිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) කාර්යඵල ඇගයීම තුළින් සේව්‍යයා සහ සේවකයාට අත්වන ප්‍රතිලාභ **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) රැකියාස්ථ පුහුණුව ලබා දිය හැකි ආකාර **දෙකක්** දක්වා, ඒ මගින් සංවිධානයකට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සඵලදායී දුක්ගැනවිලි නිරාකරණ ක්‍රියාවලිය මගින් ව්‍යාපාරයකට හිමිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**8.** (i) (අ) 'ඉවත්වයාමේ සම්මුඛ සාකච්ඡා' (exit interviews) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කර, එමගින් සංවිධානයකට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) දත්ත සැකසුම් ක්‍රියාවලිය උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) මූලාශ්‍රය අනුව තොරතුරු වර්ග කළ හැකි ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) දත්ත ආරක්ෂණය තහවුරු කිරීම සඳහා සමාගමකට යොදාගත හැකි ක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 'උපායමාර්ගික තොරතුරු පද්ධති' (SIS) යන්න විස්තර කර එමගින් සංවිධානයකට ඇති වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) මධ්‍ය කළමනාකරුවන්ට තීරණ ගැනීමේ දී කළමනාකරණ තොරතුරු පද්ධතිය උපකාරී වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ව්‍යාපාරවලට හා ගනුදෙනුකරුවන්ට සමාජ මාධ්‍යය තර්ජනයක් විය හැකි අවස්ථා **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සංවිධානයකට ව්‍යාපාර සැලසුමක් අවශ්‍යවන අවස්ථා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'හරිත නිෂ්පාදනයක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) හරිත නිෂ්පාදන මගින් පාරිභෝගිකයින්ට අත්වන වාසි **හතර** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

***